චක්‍රලේඛ අංක :03/2014 (1)

මගේ අංකය : බප/සසේකො/6-චක්‍රලේඛ

සමුපකාර සේවක කොමිෂන් සභාව,

බස්නාහිර පළාත.

2014. 09. 30

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,

දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල, ස.ණ.ස. සමිති සහ

ස.ණ.ස. සංගම්වල සභාපතිවරුන් වෙත.

**රාජ්‍ය සේවකයින් හට 2014 අයවැයෙන් වැඩිකල රු.1200/- දීමනාව**

**සමුපකාර සේවකයින්ට ලබා දීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් එවන ලද මගේ සමාංක හා 2014-02-28 දිනැති 03/2014 චක්‍රලේඛය හා බැදේ.

02. එම චක්‍රලේඛය මඟින්, ස්ථිර සමුපකාර සේවකයින් සඳහා අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව, තාවකාලික, අනියම් සහ දෛනික පදනම මත සේවය කරනු ලබන සේවකයින් සඳහා ද අදාල වන පරිදි ගෙවීම, බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව කොමිෂන් සභා නියමය පරිදි දන්වා සිටිමි.

03. දෛනික වැටුප් ලබන සේවකයින් සඳහා මෙම ජීවන වියදම් දීමනාව ගෙවීමේ දී , දෛනික වේතනය මත ගණනය කර ගෙවිය යුතු වේ.

04. 03/2014 චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් කොන්දේසි එලෙසම ක්‍රියාත්මක විය යුතු වන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ඩබ්.පී.එම්.පී.ආර්.ශාන්ත කුමාර මුහන්දිරම්,

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව,

බස්නාහිර පළාත.

පිටපත් : 1. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්

2. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රිඩා හා යෞවන කටයුතු, ආහාර සැපයීම් හා බෙදාහැරීම්,සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර,ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය

3. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

4. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, බස්නාහිර පළාත.

5. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව

6. සියළුම පළාත් සමුපකාර කොමිෂන් සභා ලේකම්වරුන්

7. සියළුම වෘත්තීය සමිති සංගම්